පොදු චක්‍රලේඛ අංක: 01 - 05 /2018

මගේ අංකය: 06/G/සෞ.ක.ස.සේ./2015

සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,

385,පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,

කොළඹ 10.

2018.02. 23

සියළුම ආයතන ප්‍රධානීන් වෙත,

## රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවය ස්ථාපිත කිරීම.

2016.06.14 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදි එලඹි තීරණය අනුව ස්ථාපනය කරනු ලැබූ නව රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව; අංක 2053/18 හා 2018.01.09 දින රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලදුව, එදින සිට සංවෘත සේවාවක් ලෙස රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවාව ක්‍රියාත්මක වන බව කාරුණිකව දන්වමි.

02.ඉහත තීරණය අනුව 2004.08.25 දින අංක 1355/15 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරණු ලැබූ සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව යටතේ පත්වීම් ලැබූ සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ. 17/2009 යටතේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වී 2013.12.11 දිනැති අංක 1840/34 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පළ කරන ලදුව 2013.04.02 දින සිට ක්‍රියාත්මක වන රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය යටතේ පාලනය වූ රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධරයන් ඔවුන්ගේ මනාපය පරිදි 2018.01.09 දින සිට රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පූර්ණ පාලනයට යටත් වේ.

03. <u>අන්තර්ග්‍රහණය</u>

3.1 පහත සඳහන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධරයන්ට රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කිරිමට හිමිකම් ඇත.

3.1.1 පෙර පැවති සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වී, තවදුරටත් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ වන ආයතනවල සේවය කරනු ලබන රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධරයන් ඔවුන්ගේ මනාපය පරිදි,

3.1.2 දැනට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන ආයතන වල ක්‍රියාත්මක රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ මුල් පත්වීම් ලැබූ නිලධරයන් ඔවුන්ගේ මනාපය පරිදි,

3.1.3 පෙර පැවති සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ යෙදී සිට පසුව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වී, දැනට වෙනත් රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධරයන් ඔවුන්ගේ මනාපය පරිදි,

3.1.4 පෙර පැවති සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පල කර ඇති නමුත් මේ වන විටත් අන්තර්ග්‍රහණය කර නොමැති නිලධරයන් ඔවුන්ගේ මනාපය පරිදි,

3.2 රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවය නැවත ක්‍රියාත්මක වන දිනට, සේවය කළ නිලධරයන්, රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වී එම සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන වලට යටත්ව සේවය කිරීමට මේ මගින් විධිවිධාන සැලසේ.ඒ සඳහා අදාළ නිලධරයන් මෙම චක්‍රලේඛය සමග ඇති ආකෘතිය අනුව සකස් කළ මනාප ප්‍රකාශ පත්‍රයක් සම්පූර්ණ කර තම ආයතන ප්‍රධානියා ඉදිරිපිට දී අත්සන් තබා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කල යුතුය. දෙන **ලද මනාපය කිසිසේත් පසුව වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ.**

3.3 අංක 2053/18 හා 2018.01.09 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන්ට සහ මෙම චක්‍රලේඛයේ දැක්වෙන කරුණුවලට යටත්ව රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමට 2018.07.08 දිනට හෝ එදිනට පෙර මනාපය පළ කරනු ලබන නිලධරයන් 2018.01.09 දින සිට රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කිරීම සෞඛ්‍ය ,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ඇත.

3.4 ඉහත 3.1.3 හි සඳහන් නිලධරයන්ගේ මනාප ප්‍රකාශයන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් මඟින් ඉදිරිපත් කල යුතුය.

3.5 රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා නියමිත දිනට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ නොකරන නිලධරයන් තව දුරටත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධරයන් වන බැවින් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට මනාපය පළ කිරීම සඳහා වූ අවසන් දිනෙන් පසුව (2018.07.08 දිනට) විධිමත් පරිදි සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත මුදා හරිනු ඇත.

3.6 රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය සඳහා මනාපය හෝ නොමනාපය පළ නොකරන නිලධාරීන් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට මනාපය පල නොකරන ලද නිලධාරීන් සේ සලකා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත විධිමත් පරිදි මුදා හරිනු ඇත.

3.7 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 06/2006 හි සඳහන් පන්ති ක්‍රමයට අනුරූපීව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සිට රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන් මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට පහත සඳහන් පරිදි පන්ති/ශ්‍රේණිවලට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සිටි පන්තිය / ශ්‍රේණිය | රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කරන පන්තිය / ශ්‍රේණිය |
|---|---|
| III වන ශ්‍රේණිය | III වන ශ්‍රේණිය |
| II වන ශ්‍රේණිය | II වන ශ්‍රේණිය |
| I වන ශ්‍රේණිය | I වන ශ්‍රේණිය |
| අධි පන්තිය | අධි පන්තිය |

04. **චක්‍රලේඛයේ විධිවිධාන නිලධරයන්ට දැන්වීම.**

සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය ප්‍රකාශ කිරීමට දී ඇති කාලය 2018.07.08 දිනෙන් අවසන් වේ. ඒ අනුව, තම මනාප ප්‍රකාශ පත්‍රය, අවසාන දිනය නො ඉක්මවා (අවසන් දින තෙක් නොසිට) එවන ලෙසට තම ආයතනය යටතේ සේවය කරනු ලබන සියලුම නිලධරයන් වෙත දැන්විය යුතුය. දීර්ඝ කාලීනව දේශීය නිවාඩු ලබා සිටින, විධිමත් ලෙස විදේශ නිවාඩු ලබා විදේශගතව සිටින, වෙනත් ආයතනවලට තාවකාලිකව මුදා හැර ඇති, වැඩ තහනම් කර ඇති හෝ සේවය අත්හිටුවා ඇති නිලධරයන්ටද ඔවුන් විසින් අවසන් වරට දැනුම් දී ඇති ලිපිනයන්ට ලියාපදිංචි තැපෑලෙන් මෙ බව දන්වා යැවිය යුතුවේ.

05. **මනාප ප්‍රකාශ පත්‍ර ඉදිරිපත් කිරීම.**

5.1 මනාප ප්‍රකාශ පත්‍ර ඉදිරිපත් කිරීමේදී ආයතන ප්‍රධානීන් විසින් පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගත යුතුය.

(අ) ප්‍රකාශ පත්‍රයේ ඇතුළත් කර ඇති තොරතුරු නිවැරදි බව සහ මනාප ප්‍රකාශය ඉදිරිපත් කරන නිලධාරියා එහි සඳහන් වන දිනයේ දී ප්‍රකාශය සහතික කරන නිලධාරියා/ආයතන ප්‍රධානියා ඉදිරිපිට දී අත්සන් කළ බව.

(ආ) සහතික කරන නිලධාරියා/ආයතන ප්‍රධානියා දිනය යොදමින් සහතික කර අත්සන් තබා දින මුද්‍රා /නිලමුද්‍රා තබා ඇති බව.

(ඇ) ප්‍රකාශ පත්‍රයේ අනු පිටපතක් නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇතුළත් කර ඇති බව.

5.2 රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පල කරන නිලධරයන්ගේ මනාප ප්‍රකාශ පත්‍ර පමණක් (මුල් පිටපත්) සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය. එමෙන්ම මෙම චක්‍රලේඛයට අමුණා ඇති "අ " ආකෘතියට අනුකූලව සකස් කරන ලද උප ලේඛනයක් මනාප ප්‍රකාශ පත්‍ර සමග එවිය යුතුය. මනාප ප්‍රකාශ පත්‍ර ලැබුනු බවට අදාල දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන්ට සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙනු ලැබේ.

5.3. අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ නොකළ හා නොමනාපය පළ කල නිලධාරීන්ගේ ලේඛණයක් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත මටද පිටපතක් සහිතව ඉදිරිපත් කළ යුතුය

5.4.විදේශ ගත නිලධරයන්ගේ මනාප ප්‍රකාශ පත්‍ර එරට ශ්‍රී ලංකා තානාපති කාර්යාල ප්‍රධානීන් ඉදිරිපිට දී අත්සන් කර සහතික කර සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත එවිය යුතුය.තානාපති සේවා නොමැති රටවල නිලධරයන්ගේ ප්‍රකාශ පත්‍ර අත්සන් කර සෞඛ්‍ය ,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත එවීම ප්‍රමාණවත් වේ.

06. <u>මනාපය ප්‍රකාශ කරන කාලය තුළ සේවයේ නොසිටි නිලධරයන්.</u>

සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කිරීමට දි ඇති අවසන් දිනට (2018.07.08) මනාපය පළ කිරීමට නොහැකි වූ, ඒ වන විට වැඩ තහනම් කර සේවයේ නියුක්ත නොවූ, සිය ධූරය හැරගියා සේ සලකා ඇත්තා වූ,සේවය අවසන් කළ හෝ සේවයෙන් පහ කළ අයෙකු සම්බන්ධයෙන් නැවත සේවයේ පිහිටුවීමට විනය බලධාරියා විධිමත් නියෝගයක් දී ඇති කල්හි, එවැනි නිලධරයෙකුට මෙම සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය ප්‍රකාශ කිරීම සඳහා තම මනාපය පළ කිරීමට තවත් එක් ලිත් මසකට නොවැඩි කාලයක් කල් දිය හැකිය. මෙම වගන්තියේ සඳහන් නොවන ආකාරයේ කවරකු හට හෝ මෙම විධිවිධාන අදාල නොවනු ඇත.

07. <u>වැටුප හා ජ්‍යෙෂ්ඨත්වය.</u>

7.1 රාජ්‍ය කළමනාකරන සහකාර සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි නිලධරයන් විසින් මේ වන විටත් උපයාගෙන ඇති වැටුප්,එම නිලධරයන්ට පුද්ගලික වන සේ තවදුරටත් ලැබීමට හිමිකම් ලබන අතර, ඔවුන්ගේ වැටුප් වර්ධක දිනයේ වෙනසක් සිදු නොවේ.

7.2 රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරන සහකාර සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන්ට 2009.10.14 දිනට සෞඛ්‍ය කළමනාකරන සහකාර සේවයේ යෙදී සිටි නිලධරයන්ට හිමි ජ්‍යෙෂ්ඨත්වයට ඉහළ ජ්‍යෙෂ්ඨත්වයක් හිමි නොවේ. එම නිලධරයන් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අදාල ඊළග උසස්වීම් ලබා ගැනීමේදී ඔවුන්ගේ පූර්ව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා කාලයද සලකා බලමින් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ උසස්වීම් පටිපාටිය අනුව උසස්වීම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

7.3 නිලධරයන්ගේ පත්වීම් දිනය සලකා ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරනු ලැබේ.

08. <u>ස්ථිර කිරීම්,කාර්යක්ෂමතා කඩඉම් සහ උසස්වීම්.</u>

රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10 වැනි වගන්තිය යටතේ දැක්වෙන උසස්වීම් පටිපාටියද, රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වැනි වගන්තිය යටතේ දැක්වෙන කාර්යක්ෂමතා කඩඉම් විභාග ද, අන්තර්ග්‍රහණය කරනු ලබන දින සිට අදාළ වේ.

9. <u>අන්තර්ග්‍රහණය</u>

9.1. <u>අන්තර්ග්‍රහණය කරනු ලබන III ශ්‍රේණියේ නිලධරයන්.</u>

9.1.1 පූර්ව සේවා ව්‍යවස්ථාව යටතේ බඳවා ගන්නා ලද සේවයේ ස්ථිර කර නොමැති අන්තර්ග්‍රහණය කරනු ලබන III ශ්‍රේණියේ නිලධරයන් අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කළ පසු එම සේවා

ව්‍යවස්ථාව යටතේ පත්වීම ස්ථිර කිරීම සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් කරනු ලැබේ.

9.1.2 පූර්ව සේවා ව්‍යවස්ථාව යටතේ බඳවා ගන්නා ලද, අන්තර්ග්‍රහණය කරනු ලබන III ශ්‍රේණියේ නිලධරයන් ස්ථිර කිරීමේදී රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ 7:2:2:1 සහ 7:3:2:1 උප වගන්ති වල සඳහන් බඳවා ගැනීම් පරිපාටියේ ඇතුලත් අධ්‍යාපන සුදුසුකම් අදාල නොවේ.

9.1.3 පූර්ව සේවා ව්‍යවස්ථාව යටතේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ නොකළ හා කොටසක් පමණක් සමත් අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ ඊට අනුරූපී විෂයයන්ගෙන් සමත් විය යුතුය.ඔහුන් මෙම සේවා ව්‍යවස්ථාවේ රෝහල් පරිපාලනය විෂයෙන් නිදහස් කරනු ලැබේ.

9.1.4 පූර්ව සේවා ව්‍යවස්ථාව යටතේ III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා එකදු විෂයකටවත් ඉදිරිපත් නොවූ, අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ සියලු විෂයන්ගෙන් සමත් විය යුතුය

9.2 <u>අන්තර්ග්‍රහණය කරන ලබන II ශ්‍රේණියේ නිලධරයන්</u>

9.2.1 පූර්ව සේවා ව්‍යවස්ථාව යටතේ II පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ නොකළ හා කොටසක් පමණක් සමත් II පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන් සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ II පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ සඳහන් ඊට අනුරූපී විෂයයන්ගෙන් සමත් විය යුතු අතර එවැනි නිලධරයන් රෝහල පරිපාලනය විෂය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ඇත.

9.2.2 පූර්ව සේවා ව්‍යවස්ථාව යටතේ II වන පන්තියට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයන් දෙකක් සමත් නිලධරයන් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II ශ්‍රේණියේ අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ, සෞඛ්‍ය ආයතන හා රෝහල් පරිපාලන විෂය සමත්වීම අවශ්‍ය නොවේ.

9.2.3 පූර්ව සේවා ව්‍යවස්ථාව යටතේ II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා එකදු විෂයකටවත් ඉදිරිපත් නොවූ, අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II ශ්‍රේණියේ අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ සියලු විෂයන්ගෙන් සමත් විය යුතුය

9.2.4 අන්තර්ග්‍රහණය කරනු ලැබූ II පන්තියේ නිලධරයන් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවය නැවත ක්‍රියාත්මක වන දිනට II පන්තියට අදාළ රු.26452/- වැටුප් පියවරට එළඹී හෝ පසු කර ඇත්නම් එම නිලධරයන් II පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කළා සේ සලකනු ලැබේ. රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවය නැවත ක්‍රියාත්මක වන දිනට රු.26452/- වැටුප් පියවරට එළඹී

නොමැති නිලධරයන්ට කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කිරීමට විභාග වාර හතරක (04 )ක සහන කාලයක් දෙනු ලැබේ.

9.3 <u>අන්තර්ග්‍රහණය කරනු ලබන I ශ්‍රේණියේ නිලධරයන්</u>

9.3.1 පූර්ව සේවා ව්‍යවස්ථාව යටතේ I වන පන්තියට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයන් තුනම(03) සමත් නිලධරයන් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරන සහකාර සේවයේ සඳහන් සෞඛ්‍ය ආයතන හා රෝහල් පරිපාලන විෂය සමත්වීම අවශ්‍ය නොවේ.

9.3.2 පූර්ව සේවා ව්‍යවස්ථාව යටතේ I පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය කොටසක් පමණක් සමත් I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ I පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ සඳහන් ඊට අනුරූපී විෂයයන් ගෙන් සමත් විය යුතු අතර එවැනි නිලධරයන් රෝහල පරිපාලනය විෂය සමත්විමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ඇත.

9.3.3 පූර්ව සේවා ව්‍යවස්ථාව යටතේ I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා එකදු විෂයකටවත් ඉදිරිපත් නොවූ, අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ සියලු විෂයන්ගෙන් සමත් විය යුතුය

10. <u>නොනිමි කාර්යයන්</u>

10.1 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව යටතේ පාලනය වූ නිලධරයන් සම්බන්ධයෙන්, රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවය ක්‍රියාත්මක වන දිනට පෙර ආරම්භ කරන ලද සියලුම ආයතනික කටයුතු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අවසන් කළ යුතුය.

10.2 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ යෙදී සිටිය දී චෝදනා පත්‍ර නිකුත් කර ඇති හා විධිමත් විනය පරීක්ෂණ ආරම්භ කර ඇති නිලධරයන්ගේ විනය ක්‍රියාමාර්ග සම්බන්ධව ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 10 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. අනෙකුත් විනය ක්‍රියාමාර්ග පිළිබඳව කටයුතු කිරීමට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කල යුතුය.

10.3 අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියට ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධව තීරණ ලැබුණු පසු එම විනය ලිපිගොනු ද සෞඛ්‍ය ,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

11. <u>පාලනය</u>

11.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි අර්ථ දක්වා ඇති පරිදි , අන්තර්ග්‍රහණය කරනු ලබන මාණ්ඩලික නිලධරයන්ගේ පත්කිරීම් බලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වන අතර, එම නිලධරයන්ගේ අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතුද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්ම ඉටු කරනු ඇත.

11.2 මාණ්ඩලික නොවන නිලධරයන්ගේ පත්කිරීම් බලධාරියා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් වේ.

12. <u>පාඨ අතර අනනුකූලතාවයක් ඇති වූ විට ක්‍රියා කළයුතු ආකාරය</u>

මෙම චක්‍රලේඛයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ, පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

13. <u>චක්‍රලේඛය මගින් ආවරණය නොවන කරුණු</u>

මෙම චක්‍රලේඛය මගින් ආවරණය නොවන කරුණු සම්බන්ධව තීරණ ගැනීම සෞඛ්‍ය, පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් සිදු කරනු ලැබේ.

ජනක සුගතදාස
ලේකම්
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ජනක සුගතදාස,

ලේකම්,

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

පිටපත් :1. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2. විගණකාධිපති
3. ලේකම්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
4. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
5. සියළුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් වරුන්
6. සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
7 සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

ඇමුණුම 11

**රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පල කිරිමේ අයදුම්පත.**

01. මුලකුරු සමඟ නම : ...............................................................................................................

02. සම්පූර්ණ නම : ....................................................................................................

03. සේවය : .............................. ශ්‍රේණිය : ..............................................

.................. දිනට සේවා කාලය : අවු: ......... මාස: ........ දින: ..........

04. දැනට සේවය කරන ආයතනයේ නම හා ලිපිනය : ........................................................................

05. ස්ථිර පෞද්ගලික ලිපිනය : ........................................................................
........................................................................
........................................................................

06. උපන් දිනය : ...................................

.................. දිනට වයස : අවු: ......... මාස: ........ දින:.......

07. පත්වීම ස්ථිර කල දිනය : .............................

08. සේවා විස්තරය

a) කණිෂ්ඨ සේවයක සේවය කර ඇත්නම් එම සේවා කාලයේ විස්තර :

තනතුර : ..........................................................

පත්වීම් ලිපියේ අංකය : ..........................................................

පත්වීම් දිනය : ..........................................................

b) මුල් පත්වීම ලිපිකරු/ සමාන්තර සේවාවක නම් සේවය : .................................................

තනතුර : ..........................................................

පත්වීම් ලිපියේ අංකය : ..........................................................

පත්වීම් දිනය : ..........................................................

c) උසස්වීම් පිළිබඳ විස්තර :

| | උසස් වීම් ලැබූ තනතුර/පන්තිය/ශ්‍රේණිය | උසස් වීම් ලැබූ දිනය | උසස්වීම් ලැබුන ආකාරය සේවා කාලය/ තරඟ විභාගයෙන් |
|---|---|---|---|
| කණිෂ්ඨ සේවයේ සිට ..... | | | |
| | | | |
| | | | |
| | | | |

d) අන්තර්ග්‍රහණය පිළිබඳ විස්තර

| | අන්තර්ග්‍රහණය කල දිනය |
|---|---|
| සෞඛ්‍ය ලිපිකරු සේවයට | |
| සෞඛ්‍ය කලමනාකරණ සහකාර සේවයට | |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට | |

e) කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්/නිදහස් වූ දිනය

| කාර්යක්ෂමතා කඩඉම් විභාගය | කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කල දිනය |
|---|---|
| | |
| | |
| | |

09. a) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ/.........................................................රෝහලේ/ආයතනයේ සේවයේ නියුතු..........................................................................................වන මම රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය ප්‍රකාශ කරමි.

b).ඉහත 09(a) හි මනාපය කිසිදු ආකාරයකින් වෙනස් කල නොහැකි බව තේරුම් ගතිමි.

නිලධරයාගේ නම.........................................

අත්සන.........................................  දිනය.........................................

10. (a) රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පල නොකරන බව ප්‍රකාශ කරමි.

(b) ඉහත 10 (a) හි මනාපය කිසිදු ආකාරයකින් වෙනස් කල නොහැකි බව තේරුම් ගතිමි.

නිලධරයාගේ නම.........................................

අත්සන.........................................  දිනය.........................................

11. ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කල යුතුයි.

අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති අනු අංක 01 සිට 08 දක්වා සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

දිනය.................................  .........................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

**පෙර සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සිටි දැනට වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල සේවයේ නියුතු රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධරයන් යෝජිත සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාප ප්‍රකාශය.**

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් මඟින්,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
කොළඹ 10.

**යෝජිතසෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා කරනු ලබන මනාප ප්‍රකාශය.**

01. මුලකුරු සමඟ නම :.................................................................................................................
02. නම වෙනස් කර ඇත්නම් සංශෝධිත නම :..........................................................................................
03. සේවය :.............................. ශ්‍රේණිය :.............................................
2018.01.09 දිනට සේවා කාලය : අවු: ......... මාස: ........ දින: ..........
04. දැනට සේවය කරන ආයතනයේ නම හා ලිපිනය :.........................................................................
05. ස්ථිර පෞද්ගලික ලිපිනය :.........................................................................
06. උපන් දිනය :...................................
2018.01.09 දිනට වයස : අවු: ......... මාස: ........ දින:.......
07. පත්වීම ස්ථිර කල දිනය :..............................
08. සේවා විස්තරය

a) සේවා කාලයේ විස්තර

| තනතුර | ආයතනය | සේවා කාලය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

c)උසස්වීම් පිළිබඳ විස්තර:

| | උසස් වීම් ලැබූ තනතුර/පන්තිය/ශ්‍රේණිය | උසස් වීම් ලැබූ දිනය | උසස්වීම් ලැබුන ආකාරය සේවා කාලය/ තරඟ විභාගයෙන් |
|---|---|---|---|
| කණිෂ්ඨ සේවයේ සිට ..... | | | |
| | | | |
| | | | |
| | | | |

d) අන්තර්ග්‍රහණය පිළිබඳ විස්තර

| | අන්තර්ග්‍රහණය කල දිනය |
|---|---|
| සෞඛ්‍ය ලිපිකරු සේවයට | |
| සෞඛ්‍ය කලමනාකරණ සහකාර සේවයට | |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට | |

e)කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්/නිදහස් වූ දිනය

| කාර්යක්ෂමතා කඩඉම් විභාගය | කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කල දිනය |
|---|---|
| | |
| | |
| | |

09. a)............................................................ අමාත්‍යාංශයේ/ආයතනයේසේවයේ නියුතු ........................................................................වන මම යෝජිත සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය ප්‍රකාශ කරමි.

b) ඉහත 09(a)හි මනාපය කිසිඳු ආකාරයකින් වෙනස් කල නොහැකි බව තේරුම් ගතිමි.

නිලධරයාගේ නම.......................................

අත්සන.......................................

දිනය.......................................

10. **අමාත්‍යාංශ ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කල යුතුයි.**

අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති 01සිට 08 දක්වා සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

දිනය................................

................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

11. ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,

...................................................................... සේවයේ නියුතු රාජ්‍ය කළමනාකරණ සහකාර ..................... ....................මෙය/මිය/මහතා යෝජිත සෞඛ්‍ය කළමනාකරන සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමට කරන ලද මනාප ප්‍රකාශය මේ සමඟ ඉදිරිපත් කරමි.

දිනය ........................

....................................................

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සනහා නිලමුද්‍රාව